


# ආදරණීය වික්ටෝරියා හෙවත් අන්දිරිස්ලාගේ කතාව

**ආ**දරණීය වික්ටෝරියා නවකතාව මොහාන් රාජ් මඩවල විසින් 2014 වර්ෂයේ දී රචිත නිර්මාණයකි. එහි කේන්ද්‍රීය කතා පුවත විකාශනය වන්නේ 1878 ඇරඹි දුම්රියේ ආගමනයත් සමඟ ම කන්ද උඩරට සිට පහතරටට සංක්‍රමණය වී කුලී කම්කරුවෙකු ලෙස ජීවිතය අරඹා, පසු ව අරක්කු රේන්ද ව්‍යාපාරවල නිරත වෙමින් විශාල ධනවතෙකු බවට පත් වන අන්දිරිස් නම් පුද්ගලයා වටා ය. මෙහි ප්‍රධාන චරිතය අන්දිරිස් වුව ද නවකතාකරුවා උපයුක්ත අවස්ථා හා සිද්ධි දාමය මතින් 19 වන සියවසේ ලාංකේය සමාජයේ සමාජ, ආර්ථික, ආගමික බොහෝ තතු අනාවරණය කර ගත හැකි ය. ශූර කතාකරුවෙකු වශයෙන් ඔහු විසින් කතා පුවත විකාශනයෙහිලා යථාර්ථයත්, ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතියත් සංකලනයෙන් නිපදවා ගත් අපූර්ව රීතියක් භාවිත කිරීම හේතුවෙන් පාඨකයා උක්ත නවකතාව වෙත ඇඳ බැඳ තබා ගන්නට දක්වන හැකියාව ප්‍රශස්ත මට්ටමක පවතින බව කිව යුතු ය.

නවකතාව ආරම්භ වන්නේ දුම්රියේ ආගමනය මෙනෙහි කරන අන්දිරිස්ගේ අතීත ආවර්ජනයකිනි. ලාංගනී ප්‍රනාන්දු අබේදීර විසින් රචිත කුණ්ඩාවාඩය නමැති නවකතාව ආරම්භ වන්නේ ද මෙවැනි ම වූ ප්‍රවේශයකිනි. එනම් යොහැන්නස් පීරිස් විසින් දුම්රියේ ආගමනය මෙනෙහි කරන අවස්ථාවකිනි. එවැනි ආවර්ජනා මඟින් 19 වන සියවසේ සමාජීය තතු අනාවරණය කර ගැනීමට ලැබෙන ඉඩ ප්‍රස්ථා පුළුල් ය.

මෙරට ධනවාදී සමාජ රටාවක් කරා අවතීර්ණ වන ප්‍රථම අවස්ථාව වශයෙන් හඳුන්වා දිය හැක්කේ කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය යි. එම ප්‍රතිසංස්කරණ මඟින් සාම්ප්‍රදායික වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටුණ අතර ඔවුන්ගේ නව යෝජනා හේතුවෙන් ධනේශ්වර සමාජ පසුබිමකට අඩිතාලම දැමුණි. වතු වගාව ආරම්භ වූ අතර ඊට සමගාමී ව එයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමත් ප්‍රවාහන තැපැල් යනාදී සේවාවන්ගේ සංවර්ධනයත් සිදු වුණි.

අප රට යටත්විජිතයක් බවට පත් වීමට පෙර සිට ම මත් ද්‍රව්‍ය හෙවත් සුරාව මෙරට ජනයා අතර භාවිතයේ පැවති බවට අවශ්‍ය තරම් සාක්ෂ්‍ය ඇතත් මත්පැන් අලෙවිසැල් වශයෙන් මෙරට ස්ථාපිත වූයේ ලන්දේසි සමයේ සිට ය. එහෙත් 19 වන ශත වර්ෂයේ ඉංග්‍රීසි පාලනය යටතේ මෙම වෙළදාම කොළඹ ගාල්ල සහ යාපනය යන ප්‍රදේශවල ඉතා සරු ලෙස ව්‍යාප්ත විය. සමාජ විපර්යාසයත් සමඟ විශේෂයෙන් ම ශ්‍රමිකයින්ගේ වර්ධනය වීමත් සමඟ අරක්කු රේන්ද ව්‍යාපාරය ද ප්‍රබල මුදල් උපයන මාර්ගයක් බවට පත් වූ අයුරු ද ඒ ඔස්සේ දේශීය ධනේශ්වර පන්තියේ නැගී ඒම ද හඳුනා ගත හැකි ය. මහාචාර්ය කුමාරි ජයවර්ධන විසින් රචිත **"Nobodies to Somebodies"** කෘතිය පුරා අන්තර්ගත වන්නේ මෙම ශ්‍රී ලංකාවේ යටත්විජිත ධනේශ්වරයේ නැගීම නම් වූ කතා පුවත ය. එවකට සිටි ලාංකේය ජනතාව විශේෂයෙන් ම කම්කරු ජනතාව මෙම මත්පැන් භාවිතයට කෙතෙක් ඇබ්බැහි වී සිටියේ ද යත් 1872 - 1877 දක්වා මෙරට ආණ්ඩුකාර ධූරය දැරූ විලියම් ග්‍රෙගරිගේ මතු දැක්වෙන ප්‍රකාශයෙන් එය වඩාත් සනාථ වේ.

**"ඉංග්‍රීසි පාලනය ලංකාවට බොහෝ යහපත් දේ දී ඇත. එහෙත් ඒ සමග ම අපි දිවයින පුරා එක් ශාපයක් පතුරුවා ඇත්තෙමු. එනම් බේබදුකමයි. මීට අවුරුදු කිහිපයකට උඩ දී මත්පැන් බී වෙරි වූ උඩරටවියෙකු වී නම් ඔහු තම රටවැසියන් හමුවේ නින්දාවට පත් වනු ඇත. එහෙත් දැන් මත්පැන් බී වෙරි වීම කෙතරම් සුලබද'යි කිවහොත් ඒ නින්දාව අතුරුදහන් වී ඇත."**

ප්‍රථමයෙන් සඳහන් කළ අයුරින් දුම්රියේ ආගමනය අතීත ස්මෘතීන් ඔස්සේ සමරමින් සිටින අප කතානායකයාගේ ජීවිතයේ අභ්‍යන්තරය හඳුනා ගැනීමට පාඨකයාට ඉඩ හසර පාදා දෙද්දී ඔහුගේ ජීවිතයේ හැරවුම ලක්ෂ්‍යය බවට පත් වන්නේ ද ඔහුගේ පියා වන දාවිත් අප්පු සිය මව වන කුඩා හාමිට අධික ලෙස බීමතින් පැමිණ පහර දෙන සිද්ධියකිනි. දාවිත් අප්පු අලුත් ගංතොට තැබෑරුමෙන් සප්පායම වී තම මවට පහර දීමට සැරසෙන අවස්ථාවේ දී 16 හැවිරිදි අන්දිරිස් පියාට අභියෝගයක් වීමත් සමඟ ම මවගේ ඉල්ලීම පරිදි නිවසින් අභිනික්මන් කරයි. ඔහු නිවසින් පලා යාම ඔහුගේ ජීවිතයේ විශාල පෙරළියක මුල් අඩිතාලම වූ අතර අප්‍රතිහත ධෛර්යයත්, ඔහුගේ දෛවයත් අනුව අන්දිරිස්ට ප්‍රකට රේන්දරාළ කෙනෙක් බවට පරිවර්තනය වීමට හැකි විය. ආදරණීය වික්ටෝරියා නැමති නවකතාව මඟින් පාඨකයා අවතීර්ණ වන්නේ අන්දිරිස් නම් වූ රේන්දරාළ ජීවත් වූ, ඔහු මුහුණ දුන් ඔහුට අභියෝගයක් වූ ඔහු ජය ගන්නට ප්‍රාර්ථනා කළ විසල් ලොවට යි. එනම් 19 වන සියවසෙහි ලාංකේය සමාජ යථාර්ථය යි. ලාංගනී ප්‍රනාන්දු අබේදීරගේ කුණ්ඩාවාඩයෙහි එන යොහැන්නස් පීරිස් නම් කතා නායකයා අහසට ඉණිමං බඳින්නේ ද මෙවැනිම වූ බොහෝ ප්‍රාර්ථනා පොදි බැඳ ගෙන ය. එසේ ම ආදරණීය වික්ටෝරියාහි අන්දිරිස් ද ප්‍රාර්ථනා පොදි බැඳ ගත් ලෝකයෙහි අන්ත අසරණභාවයට පත් ව මුදලින් අතිමහත් ධනවතෙක් බවට පත් වුව ද අවසන අපේක්ෂා භංගත්වයට පත් මිනිසාගේ ශෝකාලාපය හා ක්ෂුද්‍රභාවය පාඨකයාට මනාව වටහා නොදේ ද? අන්දිරිස් නම් වූ මහා ධන කුවේරයා, මහා රේන්දරාළට අවසානයේ දී තම මව වන කුඩාහාමි සිහි වේ. සොයුරිය වන රොසලිනා සිහි වේ. නවකතාව පුරාවට ම ඔහුට මව සහ සොයුරිය සිහිපත් වන ප්‍රථම අවස්ථාව මෙය යි. සැබවින් ම එක් ජීවන යථාර්ථයක් මෙමඟින් පසක් කර දීමට නවකතාකරුවා උත්සුක වනවා යැයි සිතේ. එනම් මිනිසාගේ අත්‍යාප්තිකර ආශාවන් ශෝකයෙන් කෙළවර වන බව, ශූන්‍යතාව, මිනිසාගේ ජීවන ගමන යම් අවස්ථාවක දී ප්‍රතිඵල විරහිත වන බව, පරාජය වන බව මෙමඟින්

හඳුනා ගත හැකි ය. 20 වන සියවසේ මහා ගත්කරු ලෙස හැඳින්වෙන ඇමරිකන් ජාතික අර්නස්ට් මිලර් හෙමිංවේගේ බොහෝ නිර්මාණවලින් කුළු ගැන්වෙන ජීවන දර්ශනය ද මෙයයි. **"The Old Man & The Sea"** ඊට එක් උදාහරණයක් පමණි.

දුම් කරත්තයක නැගී කොළඹ යාමට පෙරුම් පුරමින් සිටි අන්දිරිස්ට සිළිම් හයයි පැන්ස තුනක් සොයා ගැනීමට අපහසු වේ. එම අවස්ථාවේ ඔහුට මුණගැසෙන සාමෙල් නම් පුද්ගලයා අන්දිරිස්ගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය බවට පත් වේ. සාමෙල්ගේ රැකියාව වූයේ අරක්කු පීප්ප සාදා රේන්දරාළලාට විකිණීම යි. එම ව්‍යාපාරය හරහා ඉතා ඉක්මනින් නොසිතූ ධනයක් උත්පාදනය කර ගැනීමට ඔවුන්ට හැකි වන අතර සාමෙල් අකාලයේ මිය යන්නේ ද අධික බීමත්කම හේතුකොට ගෙන ය. අරක්කු රේන්ද ව්‍යාපාරය හේතු කොට ගෙන දේශීය ධනේශ්වර පැලැන්තියක් නියෝජනය වීම අන්දිරිස්ගෙන් සංකේතවත් වීම මෙන් ම අකාලයේ මිය ගියවුන් සාමෙල්ගෙන් නියෝජනය වේ යැයි සිතිය හැකි ය. ධන බලයෙන් සමාජයේ නොකළ හැක්කක් නොමැති බව සනාථ කළ හැකි අන්දිරිස් සේ ම සාමෙල්ගෙන් ද 19 වන සියවස ආඪ්‍ය වන්නට ඇතැයි මෙම නවකතාව හරහා අපට හඳුනා ගත හැකි ය.

19 වන සියවසේ ඇති වූ ශාස්ත්‍රීය ප්‍රබෝධය සමයාන්තර වශයෙන් බෞද්ධයින් සහ කිතුණුවන් අතර ඇති වූ පංච මහාවාද පිළිබඳ ව ද ඉන් මහත් ප්‍රසිද්ධියක් ඉසුලූ පානදුරා වාදය පිළිබඳව ද ආදරණීය වික්ටෝරියාහි සුළු කරුණු ප්‍රමාණයක් අන්තර්ගත ය. 1873 වර්ෂයෙහි අගෝස්තු 26 වන දින මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් බෞද්ධ පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි අතරත් කිතුණු පාර්ශවයෙන් ඉදිරිපත් ව සිටියේ ඩේවිඩ් සිල්වා පාදලිතුමා ය. එම සුවිශාල වූ සමාජ කර්තව්‍යයෙහි ප්‍රධාන දායකත්වය දරා ඇත්තේ එවකට සිටි රේන්දරාළලා වීම සැබවින් ම විමර්ශනයට බඳුන් විය යුතු කරුණකි.

එසේ ම ධනවත්කමින් හිණිපෙත්තට ම නැගි අන්දිරිස් වැන්නන්ගේ දරුවන්ට විදේශගත ව අධ්‍යාපනය ලබා දීමට පෙළඹීමත් යුරෝපීය සිරිත් විරිත් අනුකරණය කිරීමත්, එමගින් දේශීය කළු සුද්දන්ගේ පැලැන්තියක් පාදුර්භූත වීමත් මෙකල ලාංකීය සමාජ තොරතුරු මතින් අනාවරණය කර ගත හැකි ය. අන්දිරිස්ගේ පුතු වන ඇල්ෆ්‍රඩ් හා දියණිය වන වික්ටෝරිගේ චරිත සහ ඔවුන්ගේ ඇවතුම් පැවතුම් අනුසාරයෙන් මේ බව මනාව වටහා ගත හැකි ය. තතු කෙසේ වුව ද මුදල් හේතු කොට ගෙන ම අවසන බේදනීය ඉරණමකට ගොදුරු වන්නී වික්ටෝරියා ය. අන්දිරිස්ගේ පුතු වන ඇල්ෆ්‍රඩ් නීතිය හැදෑරීම සඳහා එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුල් වේ. ඇල්ෆ්‍රඩ්ගේ චර්යාවන් මඟින් සනාථ වන්නේ නව පරම්පරාවක චින්තන විප්ලවය යි.

**"ක්‍රිස්තු ධර්මය ඉගෙන ගැනීමට පටන් ගැනීමත් සමග ඉරිදා වැඩ කිරීම පාපයක් ලෙස ඇල්ෆ්‍රඩ් සිතන්නට පුරුදු වූ බව ඇත්ත ය. එහෙත් ඔහු සති අන්තයේ සෙනසුරාදා සහ ඉරිදා අර ඉංග්‍රීසි ආණ්ඩුවේ සේවය කරන සුදු නිලධාරියාගේ ගල්කිස්සේ පිහිටි බංගලාවට යන එක පාපයක් ලෙස සැලකුවේ නැත. පොතින් පතින් ලද න්‍යායික දැනුමට වඩා ඒ බංගලාවේ දී ලත් ප්‍රායෝගික දැනුම ඇල්ෆ්‍රඩ් නවමු අත්දැකීම්වලින් පුරවනු ලැබුවේ ය. ඉංග්‍රීසි සමාජයේ හැසිරෙන විට දන උගත යුතු ඇවතුම් පැවතුම් චාරිත්‍ර, වාරිත්‍ර ශිෂ්ට ගති ලක්ෂණ ඔහු එහිදී ඉගෙන ගත්තේ ය."** (241 පිː)

සැබවින් ම 19 වන සියවසේ ලාංකේය සමාජයේ ක්‍රම ක්‍රමයෙන් දේශීය කළු සුද්දන් පැලැන්තියක් බිහි වූයේ කෙසේද'යි මෙම නවකතාව මඟින් පාඨකයා හඳුනා ගනී. ජන්මයෙන් දේශීය වූත් ඇවැත්මෙන් පැවැත්මෙන් විදේශීය වූත් නව සමාජ පංතියක් හිස ඔසවමින් සමාජ විපර්යාස වේගවත් වූ අයුරු 19 වන සියවසේ සිදු වූ සැබෑ සමාජ සත්තාවන් ය. ඒවාට එරෙහිව පියදාස සිරිසේන, අනගාරික ධර්මපාල වැන්නන් ක්‍රියාත්මක වූ අයුරු ද අපගේ අතීතයෙන් මෙන් ම සාහිත්‍යය මගින් ද අධ්‍යයනය කළ හැකි ය.

මහාචාර්ය කුමාරි ජයවර්ධනගේ **"Nobodies to somebodies"** හි සිංහල පරිවර්තනය වන **"සොක්කන් ලොක්කන් වූ වගයි"** යන ග්‍රන්ථයෙහි ද උක්ත කරුණු 14 වන පරිච්ඡේදයේ සාකච්ඡා කොට ඇත.

**"ශ්‍රී ලංකාව විජිතමය පාලනයේ විවිධ වකවානු සියල්ලේදී ම අලුත් තත්ත්වයෙන් ආර්ථික වශයෙන් වාසි සලසා ගැනීමට වුවමනා වූ ද විජිතමය ආණ්ඩුව සමඟ වන තම සම්බන්ධකම් තර කර ගැනීම් වස් ක්‍රිස්තියානි ආගමට හැරීමත්, බටහිර පන්නයට හැඩ ගැසීම හා නවීකරණය වීමත් ප්‍රයෝජනවත් බැව් අවබෝධ කර ගත්තා වූ.**

**ද දේශීය ජනකොටස් සිටියහ. මෙවන් පසුබිමක් තුළ ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රධාන කොටස් හැකි තරම් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමට පමණක් නොව බටහිර ජීවන ක්‍රමයට හරවා ගැනීමට ද එමගින් තමන් මෙන් කතා කළ, ඇඳුම් ඇන්ද කෑ බිවු, ජීවත් වුණු හා කල්පනා කළ දේශීය පිරිසක් බිහි කිරීමට ද විජිතවාදී පාලකයන්ට වුවමනාවක් තිබිණි. විදේශීය පාලකයාගේ භාෂාව ආගම සිරිත් විරිත් හා දෘෂ්ටිය වැළඳ ගැනීම ද ඇතුළුව 19 වන සියවසේ දී දේශීය ධනපති පන්තියේ සිදු වූ මේ සංස්කෘතික විපර්යාසය මගින් මැකොලේ සාමි විස්තර කළ අන්දමේ ලේ සහ පාට අනුව ඉන්දිය වූ නමුත් අභිරුචිය, සදාචාරය හා බුද්ධිය අනුව ඉංග්‍රීසි වූ කළු සුද්දන් පිරිසක් ඉස්මතු වීමට මග පෑදුණි."**

19 වන සියවසේ දී ලාංකේය ධනේශ්වර පැලැන්තියට දේශපාලන බලය ලබා ගැනීමට පවා ඉවහල් වන්නේ ද ධනය කේන්ද්‍රිය කර ගැනීම සහ ඉංග්‍රීසි ආණ්ඩුව හමුවේ සුවච කීකරු ගෝලයන් බවට පත් වීමෙන් බව අන්දිරිස්ගේ පුතු වූ ඇල්ෆ්‍රඩ් විසින් සිය පියාට එවන ලද ලිපියෙන් මනා ලෙස අනාවරණය කරයි.

**"බණ්ඩාරනායකලා, ඔබේසේකරලා, සොයිසලා වගේ හැකි තරම් ළඟින් ඉංග්‍රීසි ආණ්ඩුව සමග ගනුදෙනු කරන්න. ඔවුන්ගේ විශ්වාසය දිනා ගන්න. ඉදිරි කාලයේ ලංකාවේ අනාගතය තීන්දු කරන්නේ ඔවුන්ගේ ඒ විශ්වාසය දිනා ගත් දේශපාලකයන් විසිනි."** (276 පිː)

ඇල්ෆ්‍රඩ් සතු වූ සුවිශාල ඉදිරි දැක්මෙහි ඵල විපාක ශ්‍රී ලාංකේය සමාජය වර්තමානයේ භුක්ති විඳිමින් සිටී.

ඉහතින් සාකච්ජාවට බඳුන් කළ අයුරින් 19 වන සියවසෙහි ලාංකේය සමාජයෙහි වූ සැබෑ තතු හා සැබෑ නම් ගම් ආස්වාදනීය අයුරින් ආදරණීය වික්ටෝරියා නවකතාව මගින් මතු කිරීමට කතුවරයා දක්වා ඇති සාමර්ථතාව අගය කළ හැකි මට්ටමක පවතින බව ද සාහිත්‍යය හා සමාජය අතර පවත්නා අවියෝජනීය සබඳතාව ද මනා සේ පිළිඹිබු වන බව ද සඳහන් කළ හැකි ය. සාහිත්‍යය වනාහී සැබැවින් ම සමාජයේ අර්ථවත් දර්පණ තලයක් බව ආදරණීය වික්ටෝරියා මඟින් තව දුරටත් අපට සනාථ කරන සත්‍යතාව නොවේ ද?

**චම්පා .එස් .ද සිල්වා**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**භාෂා අධ්‍යයනාංශය**

